## 1.21 බෝදිලිමා සංකල්පය පදනම් කරගත් "කන්‍යා යාගය"

පී. ජී. දිලානි රත්නායක
සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

---

## ABSTRACT

ලෞකික ජීවිතයේ නොයෙක් අපේක්ෂාවන් මුදුන්පත්කර ගැනීම සඳහා විවිධ වත්පිළිවෙත් පැවැත්වීම ශ්‍රී ලාංකිකයන් අතර දීර්ඝ කාලයක සිට පැවත එන සිරිතකි. මෙම වත්පිළිවෙත් ක්‍රමික විකාශනයකට පත්ව අද්‍යතන සමාජය තුළ පූර්ණ ශාන්තිකර්ම පද්ධතියක් ලෙස දක්නට ලැබේ. යාගහෝම, ශාන්තිකර්ම බඳු අභිචාරවිධි සඳහා මූලික වශයෙන් බලපානු ලබන්නේ මිනිසා තුළ පවතින විශ්වාසයයි. ඒ අනුව විවිධ දේව, යක්ෂ ආදී බලවේග සඳහා ඔහු තුළ පවතින විශ්වාසවලට අමතරව සත්ව ලෝකය සම්බන්ධ විවිධ විශ්වාසයන් ද ඔහු සිය ජීවිතයට බද්ධ කරගෙන ඇත. ඒ අනුව ලාංකේය ගැමි ජනතාව විවිධ සතුන්ගේ හැසිරීම් සහ ඔවුන්ගේ හඬ අනුව ජීවිතයේ සුභ අසුභ ඵල තීරණය කිරීමට පුරුදුව සිටිති. එබඳු සතුන් අතර උලමා, කැරලා, බකමූණා, හූනා, බෝදිලිමා ප්‍රධානය. මේ අතරිනුදු **බෝදිලිමා** විශේෂිත තැනක් ගනී. එම සංකල්පය පිළිබඳ ලංකාවේ බොහෝ ප්‍රදේශවල ජනතාව දන සිටිය ද නුවර කලාවියේ ජනතාව අතර බෝදිලිමා සංකල්පය විශේෂ අවධානයකින් යුතුව ව්‍යාප්තව පවතින බව හඳුනාගත හැකිය.

බෝදිලිමා සම්බන්ධ විශේෂිත වූ උපත් කතාවක් ද ඔවුන් අතර පවතී. ස්ත්‍රියකගේ දරු ගැබක් සිය කැමැත්තට ඉඩ නොදී ඇගේ ස්වාමියා විසින් විනාශ කිරීම නිසා මියගිය කාන්තාවක් "**බෝදිලිමා**" නම් යක්ෂණිය ලෙස ඉපදී තම ස්වාමිපුරුෂයා ප්‍රමුඛ සකල විධ පුරුෂ පක්ෂයෙන් පලිගැනීමට කටයුතු කරන බව ගැමියන්ගේ විශ්වාසයයි. එම යක්ෂණියගේ බලපෑමෙන් ඇතිවන අපල උපද්‍රව වලක්වා ගැනීම පිණිස නුවර කලාවිය ප්‍රදේශයේ ජනතාව විසින් "**කන්‍යා යාගය**" හෙවත් "**බෝදිලිමා බලිය**" නමැති ශාන්ති කර්මයක් පවත්වනු ලැබේ.

**සබරගමු කුමාර සමයම** සහ **පහතරට රිද්දි යාගය** ආදිය ගර්භ සංරක්ෂණය මූලික කරගත් ශාන්තිකර්ම වන අතර එහිදී සිදුවන්නේ ඒ ඒ යක්ෂයන් විසින් දරුගැබ විනාශ කරති, යි යන උපකල්පනය තුළ පිහිටා ඊට පෙරාතුව ඔවුන් තෘප්තිමත් කිරීමයි. ඒ අනුව රටයකුන්, කඩවර යකා, දළ කඩවර හෝ වටකුමාර ආදී යකුන් ගර්භනී කාන්තාවන්ගේ වෛරකාරයින් නොවන අතර ඇය ඔවුන් විෂයෙහි කළ වරදක් ද නොමැත. එහෙත් කන්‍යා යාගය සම්බන්ධයෙන් මේ තත්ත්වය ඉඳුරා වෙනස් වේ. කන්‍යා යාගයට අනුව ස්ත්‍රියගේ දරුගැබ විනාශ කරනු ලබන්නේ ඇගේ ස්වාමි පුරුෂයාය. එබැවින් එය අහඹු සිදුවීමක් ද නොවන්නේය. ගබ්සාවෙන් පසු එම ස්ත්‍රිය මිය යාම මෙහි ඇති ඛේදනීය තත්ත්වයයි. මේ නිසා ඇය සියලු ම පිරිමින් කෙරෙහි වෛරයකින් පසුවේ. ඒ අනුව දරුගැබ් හා සම්බන්ධ වෙනත් ශාන්ති කර්මයන්හි පුද ලබන්නන් යක්ෂයින් වන අතර කන්‍යා යාගයේ දී පුද පෙත් ලබනුයේ "**බෝදිලිමා**" නමින් හඳුන්වන යක්ෂණියකි. දරුගැබ් හා සම්බන්ධ වෙනත් ශාන්තිකර්මවල දී ආතුරයා නිසැක වශයෙන්ම ස්ත්‍රියක වන අතර කන්‍යා යාගයේ ආතුරයා වන්නේ පිරිමියෙකි. එසේම ඇදුරු පක්ෂය ලෙස ස්ත්‍රීන් කටයුතු කිරීම ද මෙහි විශේෂත්වයකි.

මේ අනුව කන්‍යා යාගය වනාහි දාරකෝත්පත්තිය හා ගර්භ සංරක්ෂණය මුල් කරගත් දිවයිනේ උඩරට, පහතරට හා සබරගමු සම්ප්‍රදායන්ට අයත් ශාන්ති කර්මවලින් බොහෝ දුරට වෙනස් වූ දුලබ ශාන්තිකර්මයකි. නෘත්‍ය, ගීත, වාදන සංකලනයෙන් යුත් වත්පිළිවෙත් ඇතුළත් කන්‍යා යාගයෙහි උපත් කතාව, පුද පූජා පිළිවෙළ හා අනන්‍යතා ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණයි.